රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ: 04/2011

මගේ අංකය: PSC/ET/1/28

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
අංක 177,
නාවල පාර,
නාරාහේන්පිට.

2011 අගෝස්තු 4 දින

සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ ජාතික පොලිස් කොමිෂන් සභාව අක්‍රියවීම හේතු කොට ගෙන ඉදිරිපත් කිරිමට ඉඩ ප්‍රස්ථාව නොලද අභියාචනා සලකා බැලීම.**

17වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිපාදනයන් යටතේ ක්‍රියාත්මකවූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ ජාතික පොලිස් කොමිෂන් සභාව අක්‍රියවීම හේතු කොට ගෙන, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 58(1) ව්‍යවස්ථාව ප්‍රකාරව සහ 17වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 155ඒ ව්‍යවස්ථාව ප්‍රකාරව අභියාචනා ඉදිරිපත් කිරීමට ඉඩ ප්‍රස්ථාව නොලද යම් රජයේ නිලධාරියෙකුට තම අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට 2011 සැප්තැම්බර් 30 දක්වා කාලය ලබා දීමට එම කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. ඉහත සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය පිළිබඳව අදාල සියළුම නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගත යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි

ඩී.එම්.එල්.සී.සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත් - 01.ජනාධිපති ලේකම්.
02. අග්‍රාමාත්‍ය ලේකම්.
03. අමාත්‍ය මණ්ඩල ලේකම්.